# ඒකාබද්ධ යාන්ත්‍රණය

ජනාධිපතිනිය එක් එක් තැන කර ඇති ප්‍රකාශ අනුව ඒකාබද්ධ යාන්ත්‍රණයක් ඇතිකිරීමට ඇයට ජාත්‍යන්තරව කෙරෙන බලපෑම් උග්‍රවී ඇති බව පැහැදිලි ය. එයින් අදහස්කෙරෙනුයේ ඇය ඒකාබද්ධ යාන්ත්‍රණයට විරුද්ධ බව නො වෙයි. ඇය එයට පමණක් නොව අන්තර් පාලන ඒකාධිකාරයටත් පක්ෂ වෙයි. එහෙත් ඇයට ඒ දීගත නොහැකි විය. ජාත්‍යන්තර ව හා ඊනියා රාජ්‍ය නොවන සංවිධානවලින් එල්ලවන බලපෑම් තිබිය දී ද ඇයට ඒ දීගත නොහැකිවූයේ ජාතික බලවේග විසින් දියත්කරන ලද විරුද්ධතාව හේතුකොටගෙන ය. චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය අද ජාතික හා විජාතික බලවේගවල පීඩනයට ලක්ව සිටින්නී ය. ඒ පැත්තේ සිට මේ පැත්තටත් මේ පැත්තේ සිට ඒ පැත්තටත් ඇ දෝලනයවන්නේ ඇගේ තක්සෝරුව අනුව ඒ ඒ අවස්ථාවේ දී වඩා බලවත්වන්නේ කවු ද යන්න මත ය. අද විජාතික බලවේග විශාල බලයක් දරන්නේ යැයි ඇය සිතයි. ඒ අනුව ද ඇගේ සිතැඟි පරිදි ද ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය ලබාදීම ඇගේ අපේක්ෂාව වෙයි. ජනාධිපති පුටුව හැරදමා හෝ කොටින්ට යාන්ත්‍රණය ලබාදීමට තරම් ඇය "එඩිතර" වී ඇත.

චන්ද්‍රිකා කුමාරතුංග මහත්මියට කෙතරම් වලිකෑවත් බටහිර කුමන්ත්‍රණයක් නොවුනොත් තව වැඩිකලක් ජනාධිපති පුටුවේ රැඳී සිටීමට නො හැකි ය. ඒ බව ඇය පවා මේ වන විට තේරුම්ගෙන ඇතැයි සිතිය හැකි ය. ඇය මේ සූදානම්වන්නේ යන යකා කොරහ බිඳගෙන යන්නාක් මෙන් රට බිඳ දමා ලන්ඩන් යෑමට ද? අප බොහෝ අවස්ථාවල කියා ඇති පරිදි කුමාරතුංග මහත්මිය අනුවේ දශකයෙහි මුල ලංකාවට ගෙනනු ලැබුවේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක් ලවා ඊළම ලබාදීමට ය. ඊනියා රාජ්‍ය නොවන සංවිධානවල හා එවකට මහජන පක්ෂයට අයත්ව සිටි ඇතැමකුගේත් ශ්‍රී ල නි පක්ෂයේ කිහිප දෙනකුගේත් බලාපොරොත්තුව වූයේ එයයි. එහි දී කසිකබල් සතිඅන්ත පත්තර කඩමාල්ලක කර්තෘ කෙනකු විසින් කරන ලද කාර්යභාරය ද අමතක නොකළ යුතු ය.

විජාතික බලවේගවල අවශ්‍යතාව කුමක් වුව ද ජාතික බලවේග තවමත් යම් පමණකට හෝ ශක්තිමත් වූ බැවින් කුමාරතුංග මහත්මියට ඒ බලාපොරොත්තු ඉටුකිරීමට නො හැකි විය. එහි ප්‍රතිඵලය වූයේ ඊනියා රාජ්‍ය නොවන නඩය ඇගෙන් දුරස්ථ වීම ය. මේ නඩයේ ඇතැමුන් අද මහින්ද රාජපක්ෂ මහතා වටා එක්වන්නේ ඒ මහතාගේවත් රටේවත් යහපතට නම් නො වෙයි. කුමාරතුංග මහත්මියගෙන් ඒ පිරිස් දුරස්ථවීම සමග ඔවුන්ගේ සැලසුමේ එක් කොටසක් ලෙස ශ්‍රී ල නි පක්ෂයට එකතු වී සිටි ජී. එල්. පීරිස් මහතා තවත් පිරිසක් කැටුව ආපසු තමාට පුරුදු එ ජා පක්ෂයට ගියේ ය. පීරිස් මහතා ශ්‍රී ල නි පක්ෂයට එක්වූයේ කොටි විසින් ඝාතනයකරනු ලැබූ නීලන් තිරුචෙල්වම් මහතා හරහා ය. පීරිස් මහතාගේ කාර්යභාරය වූයේ ශ්‍රී ල නි පක්ෂය ප්‍රමුඛ ආණ්ඩුවක ඊළාම් ව්‍යවස්ථාව නිර්මානය කිරීම ය. ඔහුට තම කාර්යය කරගැනීමට නොහැකි වූ තැන ඔහු ආපසු එ ජා පක්ෂයට යන බව අප කීවේ පීරිස් මහතාවත් ඒ ගැන සිතා නොතිබූ අවධියක දී ය. කෙසේ හෝ අද ඊනියා රාජ්‍ය නොවන නඩය ද එ ජා පක්ෂයේ අතකොළු වී ඇත. බටහිර ක්‍රිස්තියානි රටවලින් රාජ්‍ය මට්ටමින් ද ආධාර ලබන මේ නඩයට අද එසේ අතකොළුවීම හැර කරන්නට හැකි වෙනත් දෙයක් නැත. මේ නඩය අද සිවරාම් හෙවත් තාරකී ගේ ඝාතනය සිංහල බෞද්ධයන් මත පැටවීමේ කොන්ත්‍රාත්තුව භාරගෙන ඇත. ඒ වෙනුවෙන් ඔවුහු පෝස්ටර අලවති. පිකට්ටු පවත්වති. පෙළපාලි යති. සිවරාම් කොටි සංවිධනයට මූලික වශයෙන් හිතවත් වුවත් ඊනියා රාජ්‍ය නොවන නඩය ද විවේචනය කෙළේ ය. ඔහුගේ ඝාතනය ගැන අසා බැලිය යුත්තේ ද රාජ්‍ය නොවන සංවිධානවලින් හා බටහිරයන්ගෙන් ම මිස සිංහලයන්ගෙන් නො වෙයි. සිංහලයන්ට තමන් අතර ජීවත් වූ සිවරාම් ගැන සැලකිලිමත්වීමටවත් අවශ්‍ය නො වීයැයි කිව හැකි ය.

ඊළම් දීම සඳහා ලන්ඩනයෙන් කොළඹට ගෙන්වනු ලැබූ කුමාරතුංග මහත්මියට අවුරුදු දහයකටත් වඩා ජනාධිපති මන්දිරයේ සිට ආපසු සුද්දන්ගේ රටටම යෑමට සිදු වී ඇත්තේ හිස් අතින් ය. එකල සුද්දෝ එංගලන්තයේ සිට කොළඹට පැමිණ ආණ්ඩුකාරයාගේ නිවසේ ටික කලක් පදිංචිව සිට ආපසු එංගලන්තයට ගියහ. කුමාරතුග මහත්මිය ද බොහෝ දුරට ඒ හා සමාන වෙයි. ජනතාවගේ ඡන්දයෙන් පත්වුව ද ඇය මුල් පුටුවේ සිටියේ බටහිරයන්ගේ කැමැත්ත පරිදි ය. අද ඇයට බටහිරයන්ගේ කැමැත්තක් නැත. ඇයට ආපසු යෑමට සිදු වී ඇත. එහෙත් ඇයට යෑමට සිදු වී ඇත්තේ ඊළම තබා එයට මගපාදන ඊනියා අන්තර්වාර පාලන අධිකාරියවත් පිහිටුවීමට නො හැකිව ය. අද ඇයට

© Prof. Nalin De Silva

අවශ්‍ය වී ඇත්තේ අවසාන මොහොතේ හෝ බටහිරයන් සතුටු කිරීමට හා ඇගේ සිතැඟි ඉටුකර ගැනීමට ය. ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය දීමට ඇය සූදානම්වන්නේ එබැවින් ය.

එහෙත් ජාතික බලවේග එයට විරුද්ධ වෙයි. අද ජාතික බලවේග සමග එක් වී ඇති ජ වි පෙරමුණ නොමැතිව ඇයට ආණ්ඩුව කරගෙන යෑමට නො හැකි ය. එහෙත් ජ වි පෙරමුණේ සහාය නොමැතිව හෝ ඒකාබද්ධ යාන්ත්‍රණය ලෙස නම්කෙරී ඇති රට බෙදන යාන්ත්‍රණය පිහිටුවීමට ඇය සූදානම් ය. ඇගේ ස්ථාවරය පිළිබඳ ව සුදු නෙළුම් ව්‍යාපාරයේ සිටි ඩිලාන් පෙරේරලා වැනි සිංහල විරෝධීන් හැරුණු විට අනෙක් ශ්‍රී ල නි පාක්ෂිකයන් විමසා බැලිය යුතු ය. ඇය සූදානම් වන්නේ ආණ්ඩුව බිඳ දමා හෝ තම බටහිර ස්වාමීන් සතුටුකිරීමට ය. ආණ්ඩුව බිඳ වැටුණාට ඇයට වන පාඩුවක් නැත. ඇය තව ටික කලකට සන්ධාන ආණ්ඩුව තිබුණත් නැතත් ජනාධිපතිනිය වෙයි. ජනාධිපති කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසු බටහිරයන් මහා කුමන්ත්‍රණයක් කර ඇය රඳවා නොගතහොත් ඇයට සිදුවන්නේ ආපසු යෑමට ය. එවිට රටේ ශ්‍රී ල නි ප ආණ්ඩුවක් ඇත් ද යන්න ඇයගේ භාෂාවෙන් ම කියන්නේ නම් ඇයට සත පහක්වත් වටිනා දෙයක් නො වෙයි.

ඇගේ දැන් බලාපොරොත්තුව වන්නේ රට බෙදන යාන්ත්‍රණය දී හැකිනම් බටහිරයන්ගේ ආධාරයෙන් යම් උපක්‍රමයකින් ජනාධිපතිධුරයේ තවදුරටත් රැඳී සිරීමට ය. නැත්නම් කොරහ බිඳ දමා ආපසු ආණ්ඩුකාරයන්ගේ රටට යෑමට ය. ඒ කුමක් වුවත් ශ්‍රී ල නි පක්ෂයට වැඩක් නොව අවැඩක් ම සිදුවෙයි. එහෙත් ශ්‍රී ල නි පාක්ෂිකයෝ අද මුනිවත රකිති. ඒ ඔවුන් මුනිවරුන් වීම නිසා නොවන බව සියල්ලෝ ම දනිති. මෙරට දේශපාලන පක්ෂ පමණක් නොව සඟ සසුන හැරෙන්නට අනෙක් ආයතන සියල්ලක්ම පාහේ ක්‍රියාකරන්නේ නායකයාට අවශ්‍ය අන්දමට ය. ඒ සිංහල බෞද්ධ සංස්කෘතික ලක්ෂණයක් නොව බටහිරයන්ගෙන් ලබාගත්තක් වෙයි. බටහිරයන්ගේ ඊනියා ප්‍රජාතන්ත්‍රවාදය ගැන ටෝනි බ්ලෙයාරගෙන් අසාගත හැකි ය. අද බ්‍රිතාන්‍ය ලේබර් පක්ෂය කටයුතු කරන්නේ ක්ලෙමන්ට් ඇට්ලිට තබා හැරල්ඩ් විල්සන්ටවත් අවශ්‍ය ආකාරයට නොවන බව බ්ලෙයාර් පොතේගුරු දේශපාලන විද්‍යාඥයන්ට කියා දෙනු ඇත.

නායකයාට හෝ ප්‍රධානියාට හෝ විරුද්ධව කිසිවක් මුහුණට හෝ ප්‍රසිද්ධියේ නොකියන දුර්ගුණය ශ්‍රී ල නි පක්ෂයේ ද ඇති බැවින් අද කුමාරතුංග මහත්මියගේ විජාතික ගැති ප්‍රතිපත්තිය පක්ෂයේ ද ප්‍රතිපත්තිය බවට පත් වී ඇත. ඇගේ ප්‍රතිපත්තිය වූයේ ද වන්නේ ද මහජන පක්ෂයේ ප්‍රතිපත්තිය මිස ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්තිය නො වෙයි. ඇය කියන්නේ ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය පිහිටුවීම ජයග්‍රහණයක් බව ය. එය සාමයට මාවත බව ය. අද කොටින්ට උතුරු හා නැගෙනහිර පළාත්වල බලයක් නැත. එසේ බලයක් නැති සංවිධානයකට ඒ පළාත්වල ආණ්ඩුව හා සමතත්ත්වයක් ලබා දීම යාන්ත්‍රණයේ අවශ්‍යතාවය ය. කොටි අද ඒ පළාත්වල ඉතා කුඩා ප්‍රදේශයකට කොටු වී සිටිති. යාන්ත්‍රණයෙන් සිදුවන්නේ කොටින්ට ඒ පළාත් දෙකෙහිම සෑම තැනකම කටයුතු කිරීමට නිල යාන්ත්‍රණයක් සැපයීම ය. රනිල් - ප්‍රභාකරන් හිවිසුම හෙවත් ඊනියා අවබෝධතා ගිවිසුමෙන් පසුව කොටි කෙළේ ඒ ගිවිසුම දඩමීමා කරගෙන ඔවුන්ගේ කටයුතු උතුරු හා නැගෙනහිර පළාත්වල පමණක් නොව මු රටටම ව්‍යාප්තකිරීමට උත්සාහ කිරීම ය. ඔවුන් ඒ ගිවිසුම ද දහස්වාරයකට වඩා කඩා ඇත. එසේ ගිවිසුම කැඩීම ගැන නිරීක්ෂණ කමිටුව නිශ්ශබ්ද වෙයි.

කුමාරතුංග මහත්මිය කියන සාමය කොටි හුරතල් කිරීම මිස අනෙකක් නො වෙයි. රට බෙදන යාන්ත්‍රණයෙන් කෙලින් ම රට බෙදන්නේ නැතැයි ජනාධිපතිභක්තිකයකු කීමට ඉඩ ඇත. බැලූ බැල්මට එය ඇත්තකි. එහෙත් එමගින් උතුරු හා නැගෙනහිර පළාත්වල ආණ්ඩුව හා සම තත්ත්වයෙන් හා නියෝජනත්වය අතින් ගත්කල සිංහලයන්ට ඉතා අවාසි සහගත ආකාරයකින් ක්‍රියාත්මකවන කොටින්ට රට බෙදා ඊළම ලබාගැනීම සඳහා අවශ්‍ය පසුබිම සැලසෙයි. ඊනියා ඒකාබද්ධ යාන්ත්‍රණය රට බෙදන යාන්ත්‍රණයක් වන්නේ ඒ නිසා ය. රට බෙදන යාන්ත්‍රණයට දෙමළ ජනයාගෙන් ද වැඩි පිරිසක් විරුද්ධ වෙයි. ආනන්දසංගරි මහතා කොටින්ට බලතල දීමට විරුද්ධ ය. කරුණා ඊනියා යාන්ත්‍රණයට පක්ෂපාති නො වෙයි. එයට පක්ෂ වන්නේ කොටි, ඔවුන්ගේ පාර්ලිමේන්තු නියොජිතයන්, කුමාරතුංග මහත්මිය, ඩිලාන් පෙරේරා වැන්නන්, ඊනියා රාජ්‍ය නොවන්නන්, පල්ලිය හා ඒ සියල්ලන් පසුපස සිටින බටහිර ක්‍රිස්තියානි රාජ්‍ය ය. කොටි කවුදැයි අද වන විට දෙමළ හින්දු ජනයා අවබෝධ කරගනිමින් සිටිති. සිංහල බෞද්ධයන් කොටි කවුදැයි දැනගත්තේ ඩිලාන් පෙරේරාලාට හා රාජ්‍ය නොවන්නන්ට නොතේරුණ ද බොහෝ කලකට පෙර ය.

© Prof. Nalin De Silva